# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
## Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | |
|---|---|
| **ව්‍යවසායකත්ව අධ්‍යයනය I** | **පැය එකයි** |
| **முயற்சியாண்மைக் கல்வி I** | **ஒரு மணித்தியாலம்** |
| **Entrepreneurship Studies I** | ***One hour*** |

නම:- ..................................................................................................................

**සැළකිය යුතුයි.** i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. ii. අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් අංකය ට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න. iii. එම පිළිතුරු පත්‍රය පිටපුස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01) ව්‍යවසායකයා යනු,

(i) නිෂ්පාදන සාධක මෙහෙයවීමේ නිරතවන්නා ය.

(ii) ව්‍යාපාර ක්‍රියාවලියේ යෙදී සිටින්නා ය.

(iii) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නා ය.

(iv) වැටුපට කායික හා මානසික ශ්‍රමය සපයන්නා ය.

02) ව්‍යවසායකයකු සතු, සැම විටම නිදහස් මතධාරියෙකු ලෙස ක්‍රියාකිරීමේ ගුණාංගය කුමන නමකින් හැඳින්වේ ද,

(i) නම්‍යශීලීත්වය (ii) ස්වාධීනත්වය

(iii) සුභවාදී වීම (iv) පරිසර සංවේදී වීම

03) ව්‍යවසායකයෙකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි ක්‍රමයක් නොවන්නේ,

(i) නිර්මාණාත්මක හැසිරීම් ආදේශනය කිරීමය. (ii) කුතුහලය දිරිමත් කිරීම ය.

(iii) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීමය. (iv) අසාර්ථකත්වය ඉවසීම ය.

04) නිර්මාණශිලිත්වය සඳහා බාධාකාරි වන සාධකයක් වන්නේ,

(i) වැරදීම් හා විවේචන සඳහා ඇති බිය (ii) නීතිගරුක වීම

(iii) ක්ෂණික ප්‍රතිඵල නොතකා ඉවසීමෙන් ක්‍රියා කිරීම (iv) තර්කානුකූල වීම

05) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකමක් නොවන්නේ,

(i) ආර්ථික කටයුත්තක යෙදීම (ii) නිෂ්පාදන තීරණ ගැනීම

(iii) පවතින සම්පත්වලින් උපරිම ඵල ලබා ගැනීම (iv) ස්වයං පෙළඹ වීම

06) භාණ්ඩ හා සේවා යනු මිනිස් අවශ්‍යතා සපුරාලන ඕනෑම දෙයකි. මේ අනුව මිනිස් අවශ්‍යතා සපුරාලන සේවාවක ලක්ෂණයක් වන්නේ,

(i) අස්පෘශ්‍ය වීම.
(ii) ගබඩා කළ හැකි වීම.
(iii) සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම.
(iv) සමජාතීය බව අපේක්ෂා කළහැකි වීම.

07) කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න,

(i) කුඩා ප්‍රමාණයේ ප්‍රාග්ධනය, කුඩා ප්‍රදේශයකට සීමා වීම, අඩු සේවක සංඛ්‍යාව
(ii) ස්වාධීන තීරණ ගත හැකි වීම, තනි අයිතිකරුවකු සිටීම, මෙහෙයවීම දුෂ්කර වීම
(iii) කුඩා ප්‍රාග්ධනයක් යෙදීම, ස්වාධීන තීරණ ගැනීම, පුළුල් ප්‍රදේශයකට පැතිරීම
(iv) ස්වාධීන මෙහෙයවීම, අයිතිය පුද්ගලයින් අතර බෙදීයාම, අඩු ආයෝජනය

08) නූතන ව්‍යාපාර පරිසරය තුල දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,

(i) තරඟකාරීත්වය වැඩි වීම.
(ii) ව්‍යාපාරිකයා බලවත් වීම.
(iii) පාරිභෝගිකයා බලවත් වීම.
(iv) ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම.

09) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

(i) සම්පත්, සේවකයන්, ප්‍රජාව, තාක්ෂණය.
(ii) ප්‍රජාව, සමාජ හා සංස්කෘතිය, තාක්ෂණය, සම්පත්.
(iii) කළමනාකරුවන්, සේවකයන්, සම්පත්, අයිතිකරුවන්.
(iv) සම්පත්, අයිතිකරුවන්, ප්‍රජාව, සමාජ සංස්කෘතිය.

10) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ තුන වන්නේ,

(i) ප්‍රාථමික, ද්විතියික, තෘතියික.
(ii) ප්‍රාථමික, නිමැවුම්, ඉදිකිරීම්.
(iii) ඉදිකිරීම්, වෙළඳාම, නිමැවුම්.
(iv) ධීවර, ඉදිකිරීම්, වෙළඳාම.

11) යම් පුද්ගලයෙකුගේ නව සොයාගැනීමක් වෙනුවෙන් ලබා ගන්නා පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය නම්,

(i) අවුරුදු 7 කි.
(ii) අවුරුදු 20 කි.
(iii) අවුරුදු 15 කි.
(iv) අවුරුදු 10 කි.

12) සෑම ව්‍යාපාර අදහසක් ම ව්‍යාපාර අවස්ථාවක් නොවේ. ඒ අනුව ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණයක් වන්නේ,

(i) අනාවරණය කර ගැනීම අසීරු වීම.
(ii) විවෘත වීම.
(iii) ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වීම.
(iv) සුලභ වීම.

13) නව ව්‍යාපාරයක් සඳහා යෝග්‍ය පිවිසුම් මාර්ගයක් නොවන්නේ,

(i) නිෂ්පාදන ප්‍රභේදනය
(ii) අනුකරණය
(iii) නවෝත්පාදනය
(iv) වෙළඳපොළ හිඩැස

14) ඕනෑම කාර්යයක් සාර්ථක කර ගැනීමට අවශ්‍ය වන්නේ,

(i) දැක්මක් ය.
(ii) අරමුණක් ය.
(iii) සැලැස්මක් ය.
(iv) ක්‍රියාකාරකම් ය.

15) අභ්‍යාස පොත් සඳහා ඉලක්කගත පාරිභෝගික කොට්ඨාසයක් නොවන්නේ,

(i) ලේඛකයන් ය. (ii) පාසල් සිසුන් ය.

(iii) ගෘහණියන් ය. (iv) පෙරපාසල් සිසුන් ය.

16) ව්‍යාපාරයකට ශක්තියක් වන සාධක ඇතුළත් පිළිතුර කුමක්ද,

(i) කුසලතා සහිත කළමණාකරුවන්, ඉහළ පොළියට ණය ගැනීම
(ii) පර්යේෂණ කටයුතුවල නිරත වීම, සේවක ගැටළු
(iii) අංශ අතර මනා සම්බන්ධීකරණය, සම්පත් පරිහරණය පිළිබඳ ගැටළු
(iv) ඉතුරුම් ලෙස බැංකු තැන්පතුවක් පැවතීම, අලංකාර ව්‍යාපාර පරිශ්‍රය

17) ආසන්න පරිසරය පැහැදිලි කෙරෙන උදාහරණයකි.

(i) ණය පොළී අනුපාතය වෙනස් කිරීම (ii) වැඩිහිටි ජනගහනය ඉහළ යාම

(iii) තරගකරුවන් ස්වකීය උපායමාර්ග වෙනස් කිරීම (iv) අන්තර්ජාතික ගිවිසුම්වලට එළඹීම

18) ව්‍යාපාරයක අලෙවිකරණ උපාය මාර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රචාරණය. (ii) නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය.

(iii) නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රචාරණය. (iv) නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය.

19) ඉදිරි නිශ්චිත කාලයකදී ව්‍යවසායකයා වෙළඳපොලට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය තීරණය කිරීම,

(i) අලෙවිකරණයයි. (ii) විකුණුම් පුරෝකථනයයි.

(iii) ඉල්ලුම් පුරෝකථනයයි. (iv) විකුණුම් ප්‍රවර්ධනයයි.

- වරුණි දිනකට පාපිසි 25ක් නිෂ්පාදනය කරන අතර එකක් රු. 75 බැගින් අලෙවි කිරීමට අදහස් කරයි. ඉහත සිද්ධිය ඇසුරෙන් 20, 21 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

20) වරුණිගේ ව්‍යාපාරයේ දෛනික විකුණුම් ආදායම විය හැක්කේ ,

(i) රු. 1750 (ii) රු. 1875

(iii) රු. 2050 (iv) රු. 2500

21) ඇයගේ මාසික විකුණුම් ආදායම විය හැක්කේ,

(i) රු. 51, 500 (ii) රු. 56, 250

(iii) රු. 58, 250 (iv) රු. 65, 500

22) නිෂ්පාදන සැලැස්මක ඇතුලත් වන තොරතුරක් නොවන්නේ,

(i) නිෂ්පාදන ක්‍රියාවලිය (ii) ඒකකයක පිරිවැය

(iii) නිෂ්පාදන ස්ථාවර වත්කම් (iv) ආරම්භක වියදම්

23) යම් නිෂ්පාදිත ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම සඳහා ද්‍රව්‍ය, ශ්‍රමය හා වෙනත් වියදම් වෙනුවෙන් දරණ ලද පිරිවැය වල එකතුව,

(i) ඒකක පිරිවැයයි. (ii) මුළු නිෂ්පාදන පිරිවැයයි.

(iii) පොදු කාර්ය පිරිවැයයි. (iv) ප්‍රාථමික පිරිවැයයි.

24) ව්‍යාපාර සැලැස්මක මූලිකාංගයක් නොවන්නේ,

(i) කර්මාන්ත සැලැස්ම (ii) අලෙවි සැලැස්ම

(iii) විධායක සාරාංශය (iv) පරිපාලන සැලැස්ම

25) ව්‍යාපාරයේ පිහිටීම, අලෙවි පුරෝකථනය, අලෙවි ප්‍රදේශ, වාර්ෂික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය යන කරුණු පිළිබඳව තොරතුරු සාරාංශගතව ඉදිරිපත් කරනු ලබන්නේ,

(i) නිෂ්පාදන සැලැස්මෙහි ය. (ii) අලෙවි සැලැස්මෙහි ය.

(iii) මූල්‍ය සැලැස්මෙහි ය. (iv) විධායක සාරාංශයෙහි ය.

26) නිෂ්පාදිත ප්‍රභේදනය යනුවෙන් හඳුන්වන්නේ,

(i) ඉල්ලුමට අනුව භාණ්ඩයේ මිල වෙනස් කිරීම

(ii) තරගකරුවන්ගේ නිෂ්පාදන උපක්‍රම තම ව්‍යාපාරයේද භාවිතා කිරීම

(iii) තරගකාරී නිෂ්පාදිත වලින් වෙන් කර හඳුනා ගැනීමට තම නිෂ්පාදිතයට වෙනස්කම් සිදු කිරීම

(iv) තම නිෂ්පාදිතය තරගකරුවන්ගේ නිෂ්පාදිත ගුණාංග සහිතව වෙළඳපලට ඉදිරිපත් කිරීම

27) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී විවිධ වියදම් දැරීමට සිදුවේ. පහත සඳහන් කරුණු අතරින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදමක් වන්නේ,

(i) බැංකු ණය වාරික හා පොළී ගෙවීම. (ii) තොග ලබාගැනීමේ වියදම.

(iii) වෙළඳපොළ සමීක්ෂණය සඳහා යන වියදම. (iv) වැටුප් හා වේතන සඳහා වියදම.

28) ව්‍යාපාර ආයතනයක් විසින් සකස් කරනු ලබන අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයක මුදල් ගලා ඒම් ලෙස සැලකිය හැක්කේ,

(i) වෙළඳ තොග ගැනීම (ii) පොත් රාක්ක සැකසීම

(iii) ණයගැතියන්ගෙන් ලැබීම් (iv) සේවක වැටුප්

29) ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන පාර්ශවයක් වශයෙන් පාරිභෝගිකයන් ව්‍යාපාරයෙන් අපේක්ෂා කරනු ලබන්නේ,

(i) යෙදූ ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීම. (ii) සාධාරණ ආදායමක් ලැබීම.

(iii) සාධාරණ මිලකට ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම. (iv) නීතිරීති වලට අනුකූල වීම.

30) ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී දෛනිකව දැරීමට සිදුවන වියදමක් වන්නේ,

(i) ස්ථාවර වත්කම් මිලට ගැනීම. (ii) ලියාපදිංචි ගාස්තු.

(iii) ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ වියදම්. (iv) සේවක වැටුප් සඳහා යන වියදම්.

31) කේවලස්වාමි ව්‍යාපාරයක පමණක් දැකිය හැකි වාසියක් වන්නේ,

(i) ස්වාධීනව තීරණ ගතහැකි වීම (ii) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම

(iii) ලියාපදිංචිය අනිවාර්ය නොවීම (iv) බලපාන නීති රීති අල්ප වීම

32) ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,

(i) පොදු අරමුණක් පැවතීම (ii) නිශ්චිත ස්ථානයක් පැවතීම

(iii) සීමිත සම්පත් භාවිතය (iv) ආර්ථික කටයුත්තක නියැලීම

33) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි.

(i) සංස්ථාපිත සමාගම් (ii) හවුල් ව්‍යාපාර

(iii) වරලත් ව්‍යාපාර (iv) සංස්ථා

34) කේවල ස්වාමී ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්නේ නම් එය කුමන පනතක් යටතේ සිදුකල යුතු ද?

(i) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත. (ii) 2007 අංක 7 දරණ සමාගම් පනත.

(iii) 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ පනත. (iv) 1890 හවුල් ආඥා පනත.

35) වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශව ගණන,

(i) 3 කි. (ii) 2 කි. (iii) 4 කි. (iv) 6 කි.

- 36, 37 ප්‍රශ්න වලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න. අමරගේ ව්‍යාපාරයේ නිෂ්පාදන වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක් පහත දැක්වේ.

මෙම ව්‍යාපාරය දිනකට සිමෙන්ති ගල් 500ක් නිෂ්පාදනය කරන අතර ඒ සඳහා යන දෛනික වියදම් ඇස්තමේන්තුවට පහත වියදම් අයත් වේ.

(1) 1ක් රු. 1,000 බැගින් සිමෙන්ති මළු 10 යි. (2) 1ක් රු.6,000 බැගින් වැලි කියුබ් 1 යි.

(3) ශ්‍රමික වැටුප සිමෙන්ති ගලකට රු. 5 බැගින් (4) ජල ගාස්තුව රු. 500 යි.

36) සිමෙන්ති ගල් 500 නිපදවීම සඳහා වැයවන මුළු පිරිවැය කොපමණ ද?

(i) රු. 16 000 (ii) රු. 19 000 (iii) රු. 24 500 (iv) රු. 30 000

37) සිමෙන්ති ගලක් නිපදවීම සඳහා වැයවන මුදල කොපමණ ද?

(i) රු. 32 (ii) රු. 36 (iii) රු. 38 (iv) රු. 50

38) මුළු ආයෝජන ඇස්තමේන්තුවකින් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,

(i) ව්‍යාපාරයේ ආයෝජන තොරතුරු ගිණුම්ගත කිරීමට

(ii) අපේක්ෂිත ව්‍යාපාරයේ ආරම්භයට පෙර දැරිය යුතු වියදම් ගණනය කිරීමට

(iii) අපේක්ෂිත ව්‍යාපාරයට කොපමණ මුදලක් ආයෝජනය කල යුතු දැයි කල්තියා දැන ගැනීම

(iv) අපේක්ෂිත ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය ගණනය කිරීම

39) මූල්‍ය සැලැස්මක අන්තර්ගත වන්නේ,

(i) ව්‍යාපාරය ආරම්භයට පෙර කාර්යයන් හා වියදම්

(ii) මුළු ආයෝජන ඇස්තමේන්තුව

(iii) අපේක්ෂිත මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් සහ ව්‍යාපාර ප්‍රතිඵලය

(iv) ඉහත සියල්ලම

40) ව්‍යාපාරයකට සමාජ වගකීම් ඉටුකළ හැකි ආකාරයකි.

(i) ජාතික වගකීම් ලෙස (ii) සදාචාරාත්මක වගකීම් ලෙස

(iii) පුද්ගල වගකීම් ලෙස (iv) රාජ්‍ය වගකීම් ලෙස